වවුනියාව දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව

වවුනියාව දිස්ත්‍රික්කය.

---------------------------------------------------

1. මූල්‍ය ප්‍රකාශ

------------------

1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම

------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ 2014 මාර්තු 20 දින ද ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශ 2013 මාර්තු 27 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 ජුලි 15 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී.

1.2 මතය

----------

මාගේ වාර්තාවේ 1.3 ඡේදයේ සඳහන් කරුණු හේතුවෙන් මූල්‍ය ප්‍රකාශයන්ට ඇතිවන බලපෑම් හැර 2013 දෙසැම්බර් 31 දිනට වවුනියව දකුණ දෙමළ ප්‍රාදේශීය සභාවේ වැඩකටයුතු වල තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන පරිදි ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර තිබුණි.

1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම්

----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

---------------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශයන්හි අනාවරණය කර නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශ සමග මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) සභාව විසින් ප්‍රධාන ලෙජරය, ශේෂ පිරික්සුම සහ ආදායම් හා වියදම් ගිණුම සම්බන්ධයෙන් මුදල් මිණුම් සංකල්පය අනුගමනය කර නොතිබුණි.

(ඇ) පහත සඳහන් විෂයයන් සම්බන්ධයෙන් ප්‍රධාන ලෙජරයෙහි, ලෙජර ගිණුම් පවත්වා නොතිබුණි.

| විෂයය | මුදල |
|---|---|
| | රු. |
| දේශීය ණය හා සංවර්ධන අරමුදලට ගෙවිය යුතු ණය | 14,585,437 |
| පළාත් පාලන කොමසාරිස්වරයාගෙන් ලැබිය යුතු ප්‍රාග්ධන ප්‍රදාන | 7,297 |

(ඉ) ශේෂපත්‍රයේ සමුච්චිත අරමුදල් සහ සංචිත රු.126,969,951 ක් ලෙස දක්වනු වෙනුවට රු.129,969,951 ක් ලෙස දක්වා තිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

------------------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩල ණය පාලන ගිණුමේ ශේෂය වූ රු.1,099,010 කාර්ය මණ්ඩල ණය උපලේඛනය සමග සසඳා නොතිබුණි.

(ආ) කාර්ය මණ්ඩල ණය පාලන ගිණුමෙහි 2013 දෙසැම්බර් 31 දිනට වූ රු.2,174,350 ක් වූ ණය ශේෂය ණය ලේඛනයෙහි මාසික ශේෂය සමග සසඳා නොතිබුණි.

(ඇ) ප්‍රාදේශීය මුදල් රෙගුලාසි වල 143 වගන්තිය යටතේ පනවන ලද 1989 මුල්‍ය සහ පරිපාලන රීති ප්‍රකාරව 2013 දෙසැම්බර් 31 දිනට තැන්පතු පාලන ගිණුමෙහි ශේෂය වූ රු.6,477,094 කේවල තැන්පතු ශේෂ සමග සසඳා නොතිබුණි.

(ඈ) ආරක්ෂක තැන්පතු, ටෙන්ඩර් තැන්පතු සහ විවිධ තැන්පතු වැනි තැන්පතු සම්බන්ධයෙන් වෙනම කේවල ගිණුම් පවත්වා නොතිබුණ අතර එබැවින් තැන්පතු වල ඒ ඒ ශේෂයන් ප්‍රධාන ලෙජරයෙහි දක්වා ඇති සංඛ්‍යාවන් සමග සැසඳිය නොහැකි විය.

1.3.3 ලැබිය යුතු ගිණුම්

-----------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) මෝටර් ග්‍රේඩර ආදායම සම්බන්ධයෙන් වූ රු.174,590 ක් වූ හිඟමුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ජේ.සී.බී.යන්ත්‍රයේ ආදායම සම්බන්ධයෙන් වූ රු.214,095 ක් වූ හිඟ මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) පාර තලනයෙන් ලැබිය යුතු ආදායමට අදාළ රු.275,580 ක් වූ හිඟ මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව රු.40,543 ක් වූ අත්තිකාරම් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂය රු.58,454 ක් වූ අතර වර්ෂ 01 ඉක්ම වූ ගිණුම් ශේෂ එකතුව රු.22,277 ක් විය.

| විස්තරය | මුදල |
|---|---|
| | රු. |
| පළාත් පාලන කොමසාරිස් | 5,598 |
| වැටුප් ආපසු ගෙවීම් (පළාත් පාලන කොමසාරිස්) | 16,679 |
| එකතුව | 22,277 |

(ඊ) සභා බල ප්‍රදේශය තුල ප්‍රදර්ශනය කරන ලද වෙළඳ දැන්වීම් පහක් සම්බන්ධයෙන් වූ හිඟ වෙළඳ දැන්වීම් ගාස්තු රු.276,300 ක් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

-----------------------------------------

විගණනය සඳහා අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.77,514,989 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරිමට නොහැකි විය.

2. මූල්‍ය සමාලෝචනය

-------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම් අතිරික්තය රු.9,574,158 ක් වූ අතර එයට අනුරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම් අතිරික්තය රු.8,135,487 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

--------------------------

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| වරිපණම් සහ බදු | 3,200,000 | 3,392,984 | 2,520,572 |
| බදු කුලී | 1,928,600 | 1,729,205 | 2,246,113 |
| වෙනත් ආදායම් | 42,465,769 | 41,951,135 | 15,618,181 |
| එකතුව | 47,594,369 | 47,073,324 | 20,384,866 |

2.3 වරිපණම්

-----------

2005 සිට 2013 දක්වා කාල පරිච්ඡේදයට අදාළ රු.1,229,240 ක් වූ හිඟ වරිපණම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.4 උසාවි දඩ සහ මුද්දර ගාස්තු

----------------------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විවිධ අණ පණත් යටතේ වවුනියා මහේස්ත්‍රාත් උසාවි මගින් එකතු කරන ලද රු.2,889,459 ක් වූ උසාවි දඩ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් ලැබිය යුතු රු.9,537,497 ක් වූ මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

-------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

---------------------------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සභාව විසින් පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුමෙහි සමාලෝචිත වර්ෂය තුල සැලකිය යුතු මුදල් ප්‍රමාණයක් සංවර්ධනය කටයුතු සඳහා යොදවා නොගෙන නිෂ්ක්‍රීයව තිබුණි. විස්තර පහත දැක්වේ.

| මාසය | වියදම | මාසය අවසානයට ශේෂය |
|---|---|---|
| --------- | --------- | ------------------------------ |
| | රු. | රු. |
| ජුනි | 5,348,108 | 9,598,177 |
| ජුලි | 4,854,911 | 10,259,866 |
| අගෝස්තු | 6,844,953 | 9,573,162 |
| සැප්තැම්බර් | 9,904,013 | 6,685,710 |
| ඔක්තෝබර් | 4,900,383 | 5,130,124 |
| නොවැම්බර් | 3,336,865 | 6,589,608 |
| දෙසැම්බර් | 8,059,936 | 6,672,425 |

(ආ) කල් ඉකුත්වූ තැන්පතු රු.82,750 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 570 සහ 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුනි.

3.2 නිෂ්ක්‍රීයව සහ ඌණ උපයෝජිත වත්කම්

--------------------------------------------------

2013 ඔක්තෝබර් 31 දින මිලදී ගන්නා ලද රු.110,000 ක් වූ ට්‍රැක්ටර් කොටස් දෙකක් උපයෝජනය කර නොතිබූ අතර මෙම වාර්තාවේ දින වන විටත් නිෂ්ක්‍රීයව තිබුණි.

3.3 ආර්ථික නොවූ ගනුදෙනු

-------------------------------

සමාලෝචිත වර්ෂය තුල පිරිසිදු කිරීම් සේවා සඳහා සෞඛ්‍යාරක්ෂක කම්කරුවන් හට රු.2,539,151 ක් වූ මුදලක් ගෙවා තිබුණි. මෙයට අමතරව පෞද්ගලික පිරිසිදු කිරීම් සේවා සමාගමකටද රු.427,200 ක මුදලක් ගෙවා තිබුණි.

4. පද්ධති හා පාලන

----------------------

පහත සඳහන් පද්ධති සහ පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ස්ථාවර වත්කම් පාලනය

(ආ) ප්‍රධාන ලෙජරය පවත්වා ගැනීම

(ඇ) ආදායම් රැස්කිරීම